# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1954/2 - 2016 පෙබරවාරි මස 15 වැනි සඳුදා - 2016.02.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

### පළාත් සභා නිවේදන

**නැගෙනහිර පළාතේ පළාත් සභාව**

නැගෙනහිර පළාත් සභාවේ 2009 අංක 02 දරන නැගෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය

**ප්‍රඥප්තිය යටතේ සාදා ප්‍රසිද්ධ කරනු ලබන විධිවිධාන, රීති, නියෝග, නියමයන්, විධිවිධානයන් සහ නියම කිරීම් සංශෝධනය**

2009 සැප්තැම්බර් මස 28 වැනි දින අංක 1621/2 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වූ නැගෙනහිර පළාත් සභාවේ, 2009 අංක 02 දරන නැගෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරී නියෝගවල 4 වැනි උපලේඛනය හා 2012 මැයි මස 08 වැනි දින අංක 1757/2 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වූ උපලේඛනය 4 අවලංගු කොට ඒ වෙනුවට පහත සඳහන් උපලේඛනය ආදේශ කරනු ලැබේ.

මෙම නියෝග 2016 පෙබරවාරි මස 15 දින සිට ක්‍රියාත්මක වේ.

ඉසෙඩ්. ඒ. නසීර් අහමඩ්,<br>
ප්‍රධාන අමාත්‍ය,<br>
මුදල් සැලසුම්, නීතිය හා සාමය, පළාත් පාලන,<br>
ප්‍රාදේශීය පරිපාලන, ග්‍රාමීය සංවර්ධන, සංචාරක හා පරිසර,<br>
ගොඩනැගිලි හා ඉදිකිරීම්, ප්‍රවාහන සහ<br>
ග්‍රාමීය කර්මාන්ත හා නිවාස අමාත්‍ය,<br>
නැගෙනහිර පළාත.

2016 පෙබරවාරි මස 15 දින,<br>
ත්‍රිකුණාමලය,<br>
නැගෙනහිර පළාත් සභාවේ,<br>
මුදල් සැලසුම්, නීතිය හා සාමය,<br>
පළාත් පාලන හා ප්‍රාදේශීය පරිපාලන<br>
ග්‍රාමීය සංවර්ධන, සංචාරක හා පරිසර,<br>
ගොඩනැගිලි හා ඉදිකිරීම්, ප්‍රවාහන සහ ග්‍රාමීය කර්මාන්ත හා නිවාස<br>
අමාත්‍යාංශයේ දී ය.

*උපලේඛනය 4*

*අධිකාරිය විසින් නියම කරන ලද ගාස්තුව*

01.එම උපලේඛනයේ I වැනි තීරුවේ දක්වා ඇති කිසියම් විෂයක යම් කාර්යයක් සඳහා ගෙවිය යුතු ගාස්තුව එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ දක්වා ඇති ගාස්තු ප්‍රමාණය විය යුතු ය.

| *අනු. අංකය* | *I වැනි තීරුව කාරණය* | *II වැනි තීරුව ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණය රු. ශත* |
|---|---|---|
| 1 | අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් පත්‍ර ගාස්තුව | 350 0 |
| 2 | මගී සේවා අවසරපත්‍රයක් අළුත් කිරීමේ වාර්ෂික ගාස්තුව | 4,000 0 |
| 3 | මගී සේවා අවසරපත්‍රයක් අළුත් කිරීමේ වාර්ෂික ගාස්තුව - ප්‍රතිදාන ලබන පළාත් නිත්‍ය සේවා | 4,000 0 |
| 4 | මගී සේවා අවසරපත්‍රයක් නියමිත දිනට දීර්ඝ නොකිරීම නිසා සමුච්චිත වන හිඟ මුදල මත 10% අධිභාරයක් අයකිරීම. | - |
| 5 | අතුරු මාර්ග සටහනක් සඳහා (වර්ෂයකට හෝ ඉන් කොටසකට) | 2,000 0 |
| 6 | මගී සේවා අවසරපත්‍ර පොත - අනු පිටපතක් නිකුත් කිරීම (අස්ථානගත වීම නිසා) | 5,000 0 |
| 7 | මගී සේවා අවසරපත්‍ර පොතේ පිටු අවසන් වීම/අබලන් වීම හේතුවෙන් අනු පිටපතක් නිකුත් කිරීම | 750 0 |
| 8 | මගී සේවා අවසරපත්‍ර ලේබලය (අනුපිටපත) | 300 0 |
| 9 | විශේෂ චාරිකා බලපත්‍ර එක් දිනකට | 500 0 |
| 10 | විශේෂ චාරිකා එක් දිනකට වැඩිවන දිනයක් සඳහා | 100 0 |
| 11 | තාවකාලික බලපත්‍ර (දිනකට) | 300 0 |
| 12 | මගී සේවා අවසර පත්‍රයක් නිකුත් කරදීම (සාමාන්‍ය සේවා) - 'C' මාර්ග | 50,000 0 |
| 13 | මගී සේවා අවසර පත්‍රයක් නිකුත් කරදීම (සාමාන්‍ය සේවා) - 'B' මාර්ග | 60,000 0 |
| 14 | මගී සේවා අවසර පත්‍රයක් නිකුත් කරදීම (සාමාන්‍ය සේවා) - 'A' මාර්ග | 75,000 0 |
| 15 | මගී සේවා අවසර පත්‍රයක් නිකුත් කරදීම (සුඛෝපභෝගී සේවා) | 1,00,000 0 |
| 16 | අවසර පත්‍රයක් වෙනත් ඉල්ලුම්කරුවෙකුට පවරාදීම | 1,00,000 0 |
| 17 | අවසරපත්‍ර හිමියා මිය ගිය විට නීත්‍යානුකූල අයිතිය හිමි වන පුද්ගලයාට අවසරපත්‍රය පැවරීම (භාර්යාවට/ස්වාමියාට හෝ දරුවන්ට) | 3,000 0 |
| 18 | අවසරපත්‍ර හිමියා ජීවතුන් අතර සිටියදී ශාරීරික බෙලහීනතාවයන්, අංග විකලවීම් හෝ ආර්ථික අපහසුතාවයන් මත නීත්‍යානුකූල භාර්යාවට/ස්වාමියාට හෝ දරුවන්ට පැවරීම | 25,000 0 |
| 19 | අවසරපත්‍ර හිමියා මිය ගිය විට නීත්‍යානුකූල අනුප්‍රාප්තිකයෙකු නොවන පුද්ගලයෙකුට අවසර පත්‍රය පැවරීම (අංක 16 යන ගාස්තු ක්‍රමය අදාළ වේ) | - |
| 20 | බස්රථයක කාලසටහනක අනු පිටපතක් නිකුත් කිරීම | 100 0 |
| 21 | ධාවකයින්ගේ පොදු ඉල්ලීම මත කාල සටහන් සංශෝධනයකට (අධිකාරිය එකඟ වන අවස්ථාවල) | 250 0 |
| 22 | අතිරේක ගාස්තු සටහන් නිකුත් කිරීමට | 50 0 |
| 23 | ධාවකයින්ගේ පොදු ඉල්ලීම මත බස්රථ කාර්ය චක්‍ර සංශෝධනයකට | 100 0 |
| 24 | මගී සේවා අවසරපත්‍රයකට අදාළ බස්රථ මාරු කිරීම | 2,000 0 |
| 25 | මගී සේවා අවසරපත්‍රයට අදාළ සේවාව සංශෝධනය කිරීම (ධාවක ඉල්ලීම මත) | 4,000 0 |
| 26 | මගී සේවා ලොග්පත්‍ර ගාස්තු - පළාත් නිත්‍ය සේවා (මසකට හෝ ඉන් කොටසකට) | 750 0 |
| 27 | මගී සේවා ලොග්පත්‍ර ගාස්තු/පිවිසුම් පත්‍ර ගාස්තු - අන්තර් පළාත් නිත්‍ය සාමාන්‍ය සේවා (මසකට හෝ ඉන් කොටසකට) | 1,250 0 |
| 28 | මගී සේවා ලොග්පත්‍ර ගාස්තු/පිවිසුම් පත්‍ර ගාස්තු - අන්තර් පළාත් නිත්‍ය අර්ධ සුඛෝපභෝගී සේවා (මසකට හෝ ඉන් කොටසකට) | 1,500 0 |
| 29 | මගී සේවා ලොග්පත්‍ර ගාස්තු/පිවිසුම් පත්‍ර ගාස්තු - අන්තර් පළාත් නිත්‍ය සුඛෝපභෝගී සේවා - ආසන 30ට අඩු (මසකට හෝ ඉන් කොටසකට) | 1,500 0 |
| 30 | මගී සේවා ලොග්පත්‍ර ගාස්තු/පිවිසුම් පත්‍ර ගාස්තු - අන්තර් පළාත් නිත්‍ය සුඛෝපභෝගී සේවා - ආසන 30ට වැඩි (මසකට හෝ ඉන් කොටසකට) | 2,000 0 |

*උපලේඛනය 4 (සම්බන්ධිතයි)*

| *අනු. අංකය* | *I වැනි තීරුව කාරණය* | *II වැනි තීරුව ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණය රු. ශත* |
|---|---|---|
| 31 | මගී සේවා ලොග්පත්‍ර ගාස්තු/පිවිසුම් පත්‍ර ගාස්තු - අන්තර් පළාත් නිත්‍ය අධි සුඛෝපභෝගී සේවා (මසකට හෝ ඉන් කොටසකට) | 2,500 0 |
| 32 | මගී සේවා ලොග්පත්‍ර ගාස්තු/පිවිසුම් පත්‍ර ගාස්තු ගෙවීම ප්‍රමාද වීම නිසා සමුච්චිත වන හිඟ මුදල මත 10% අධිභාරයක් අයකිරීම | - |
| 33 | කාලසටහන් හෝ වෙනත් පරිගණක සටහන් ලබා ගැනීම මුද්‍රිත එක් කොළයකට | 50 0 |
| 34 | මසකට දින 06ක් බස්රථයක් පරීක්ෂා කිරීම හා බස් හිමියාට පරීක්ෂණ වාර්තා සැපයීමට එක් බස්රථයකට අයකරන ගාස්තුව (ධාවකයාගේ එකඟතාවය මත) | 3,000 0 |

03 - 09